
අඬන්නෙ ඇයි මගෙ සුදු අම්මා?
ජානකී සූරියආරච්චි

# අඬන්නෙ මගෙ ඇයි? සුදු අම්මා?



කතාව චිත්‍ර

පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

**ටිකිරි ප්‍රකාශකයෝ**

1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

ප්‍රථම මුද්‍රණය -2007

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-42-5
**Book Ref: T/07/129**

මුද්‍රණය
තරංජී ප්‍රින්ටිස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තුතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
30-11-2007


# අඬන්නෙ ඇයි මගෙ සුදු අම්මා




අඬන්නෙ ඇයි මගෙ සුදු අම්මා
කියන්නකෝ - මට
හිතාගන්න බෑ ඇයි කියලා
කියන්නෙ නැහැනෙ මට




උදේ පටන් ගෙයි වැඩ කරලා
අම්මට මහන්සිද
බත් උයලා රෙදි සෝදාලා
අත් දෙක රිදෙනවද



බඩ රිදුනද හිස කැක්කුමද
කියන්න අම්ම මට
පුංචි අතින් හිස අතගාලා
දෙන්නම් හාදු ගොඩ



බඩගිනි වෙලාද අඬන්නෙ මේ
අද බත් රස නැද්ද
සෙල්ලම් බත් මම රසට උයා
අම්මට කවන්නද



අම්මගෙ ආසම කහ පාට
ගවුම නැතිවෙලාද
අඬන්නෙපා මගෙ රතු ගවුම
දෙන්නම් අම්මාට



ඊයේ මහ රෑ නින්දේදී
හීනෙන් බය වුණිද
දිව දිග, දළ උල් යකා ඇවිත්
අම්ම බය කළාද



වෙලේ ගෙදර බඩ ලොකු මාමා
මගදි හම්බුණාද
අම්මව අල්ලල "ගුඩුස්" කියා
ගිලිනව කීවාද




ගමේ ඉඳන් අත්තම්මාගෙන්
ලියුමක් ආවාද
සීයට අසනීපයි කියලා
ලියලා තිබුණාද



කහ රතු සුදු අර තිත්ත බෙහෙත්
අම්මට දුන්නාද
අත්දෙක අල්ලල කට මිරිකා
අම්මට පෙව්වාද



පෙරහැර බලන්න එනමාසේ
යනකොට අපි නුවර
අම්ම එක්ක යන්නෑ කියලා
තාත්ත කීවාද



මගෙ සුදු අම්මට සැර කරලා
තාත්ත බැන්නාද
ආයෙත් සැර කළොතින් එහෙම
කියන්න අම්ම මට



දඟ කළාද අද උදේ මම
මතකත් නැනෙ මට
මගේ අතින් වරදක් වුණිද
ඔය හිත රිදුනාද



තවමත් අඬනව සුදු අම්මා
කියන්නෙ නෑ ඇයිද
කදුළු එනව මගෙ ඇස් දෙකට
ඇඬෙයි මටත් ඔන්න



බලන්න බෑ මගෙ හිතට දුකයි
අඬන්නෙපා ඔහොම
අම්මට මම - මට - සුදු අම්මා
ඉන්නව හැමදාම